ජපන් තානාපති කාර්යාලය
අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථක : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp

## පුවත්පත් නිවේදනය

ජනවාරි 23, 2012

# කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ජපන් රජයෙන් තවදුරටත් ආධාර

ජපන් රජය විසින්, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කන්දවලයි දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ මෑතකදී නැවත පදිංචි කරන ලද ජනතාවගේ ජීවන පරිසරය සහ ජීවනෝපායන් වැඩි දියුණුකිරීමේ අරමුණින් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඩොලර් 223,075 (දළ වශයෙන් රුපියල් මිලියන 25) ක ආධාරයක් ප්‍රදානය කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ විවිධ වු කෘෂිකාර්මික සහ ධීවර කටයුතු සඳහා සහයෝගය ලබාදීම සඳහා ආධාර සැපයෙන් අතර සේවාලංකා පදනම මගින් මෙම ව්‍යෘපෘතිය ක්‍රියාත්මක කෙරේ. ඒ තුලින් පවුල් 370 ක් සඳහා සෘජුවම ප්‍රතිලාභ ලැබෙනු ඇත.

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් දැක්වු සේවාලංකා පදනමේ සභාපති ආචාර්ය හර්ෂ නවරත්න මහතා පැවසුයේ ජපන් රජය මගින් නිරතුරුම ලබාදෙන සහයෝගයට බොහෝ සේ කෘතඥ පුර්වක වන බවත්, මෙම ව්‍යාපෘතිය හරහා ධීවර සහ ප්‍රජා ශාලා ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව ඉදි කෙරෙන අතර, ගමේ සිට මුහුදු දක්වා කිලෝ මීටර් 3ක් ගමන් මාර්ගයද ප්‍රතිසංස්කරණය කරන බවය. ඊට අමතරව මෙම ව්‍යාපෘතිය හරහා සපත්තු පාලම් දෙකක් සහ බෝක්කුවක් ප්‍රතිසංස්කරණය කෙරෙන අතර ගොවි ජනතාවට යල මහ කන්න දෙකම වගාකිරීම සඳහා කර්මඩු වැවේ ජල බෙදාහැරුම් බැම්මක් සහ පිටවානක් ද ඉදිකෙරෙන බවද නවරත්න මහතා පැවසීය.

බිම් මට්ටමේ මානව සුරැකීමේ ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ මෙම ආධාර ලබාදෙන අතර ඒ තුලින් ශ්‍රී ලාංකීය ජනතාවගේ මුලික අවශ්‍යතා සපුරාලීමටත්, ඔවුන්ගේ ජිවන තත්වයන් නගා සිටුවීමටත්, තිරසාර සාමය සහ සංවර්ධනය වෙනුවෙන් දායකත්වය ලබාදීමටත් හැකිවනු ඇතැයි යන්න ජපන් රජයේ අපේක්ෂාවයි. 1989 වසරේ සිට මේ දක්වා බිම් මට්ටමේ මානව සුරැකීමේ ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ මෙවැනි ව්‍යාපෘති 225ක් සඳහා ඩොලර් මිලියන 29.5 ක (දළ වශයෙන් රුපියල් මිලියන 3,400 ක) ආධාර ලබාදී ඇත.

ජපානය සහ ශ්‍රී ලංකාව අතර ගොඩනැගුනු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ගොඩනගා 60 වසරක් පිරිමේ උත්සවය මෙම වසරේදී සමරනු ඇත. සංවර්ධනයේ දැවැන්ත සහකරුවකු ලෙස ජපානය, ශ්‍රී ලංකාවේ සාමාජයිය ආර්ථික සංවර්ධනය සඳහා රජය සමග මෙන්ම රටේ ජනතාව සමග ද අත්වැල් බැඳගෙන සිටින අතර 1965 සිට 2010 වර්ෂය දක්වා ජපන් යෙන් බිලියන 1,089 (දළ වශයෙන් රුපියල් බිලියන 1,525 )ක පමණ ආධාර, ණය සහ තාක්ෂණික සහයෝගිතාවය විශේෂයෙන්ම ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) හරහා ලබාදී ඇත.

ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතාත් සේවාලංකා පදනමේ සභාපති ආචාර්ය හර්ෂ නවරත්න මහතාත් අතර, 2011 දෙසැම්බර් 16 වන දින තානාපති නිල නිවසේදී මෙම ආධාර ගිවිසුම අත්සන් කරන ලදි.


වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලයය

දුරකථන 011-2693831 දිගු අංකය 225

ඊ මේල් : cultujpn@co.mofa.go.jp